# 48

## යුග පුරුෂයාණෙනි!

*මඩකුඹුරුමුල්ලේ සෝම එච්. පතිරණ*

මහ ඇදුරි'ඳුව කැලණිය සරසවිය          දිනූ
මොළ සිය-දහස් රට-ජාතිය පිණිස          තැනූ
ගුරුදෙව් - කුමරසිංහයො - කුලතිලක          යනූ
යුග-පුරුෂයෙකි, ගුරු කුලයක පහළ          වුණූ

සිය සරසවිය වෙත විත් පෙළ ගැහෙන          වටේ
කුල දූදරුවො ජාතියෙ සම්පතය          රටේ
හැඟුමෙන් ඇදුරෙකුගෙ බස් පිටකෙරුව          කටේ
සිහිවෙන විටත් දෙනෙතින් තුටු කඳුලු          වැටේ

අත කොළුවනු එපා! කියමින් "මගෙද          ඔබ"
නව ලොව අසිරිමත් විදුහුරු දැනුම          ලැබ
පෙළ ගැස්වෙන්න නිවහල් යුගයකට          සුබ
මඟ හෙළිකළෝ මේ සරසවි දෙරණ          ගැබ

පෙන්වා ගමන් මඟ ආ සරසවිය          කරා
යන්නට නැවත ගතයුතු දේ සුරත          පුරා
පැහැදිලි කළ හෙයින් ඔබ හිඳ අසුන          අරා
මරුවෝ හැපුණි දරුවන් ගනු බැරිව          මරා

නොබැඳී පිල්වලට සිසු පෙරමුණෙ ම          සිට
යුගයෙන් - යුගය ආ දරුවන් එකතු          කොට
පරපුර නොගෙන පැමිණියෙ නම් ජනිත          රට
මතුවෙද මෙවැනි සමයක මිණි-පළිඟු          කැට

පිළිසිඳ කැලණි සරසවි මව්-තුමිය          කුසේ
ගත්මඟ මෙඔබ- පිවිතුරු සිතුවමය          ඇසේ
බරගෙන දිසාපාමොක්වරයෙකුගෙ          හිසේ
පිබිදුව කුසුම්වල මල්-එල බරය          මෙසේ

කෙටි සහ නවකතා සාහිත ඉති          හාසේ
පෙන්වා රැඳෙන මානවගුණ මඳ -          හාසේ
නොකැඩුවෙහි නම් කොරපොතු අඳබල          දැසේ
නොපිපෙයි යුගයකට රන්මල් දිනු          දේසේ

සරසවියට වැදුණු දෙස්පාලන          බූව
වටිනා දැයක සම්පත ඩැහැගෙන          කැව
යුගයක ඔබට අත්විඳ ගැනුමට          ආව
පෙරමෙන් දූ-පුතුන් බිහිවෙනවද          දාව

## 49

# මා කළණ මිතුරු!

*ජයසිරි පෙරේරා*

පැණ තිලක වන් බුහුටි හෙළ බසට සමතා න
නැණ තිලක වන් කැලණි සරසවියෙ වියතා න
පිය තිලක වන් මසිත මතකයෙහි සඳපා න
කුල තිලක කුමරසිහ මහ ඇදුරු මහතා ණ

පුරා පන් විසි වසක මතකය අවදි කළ මුදු නිසල රැය කී
සරා මහ මග වෙහෙස වූ මට ඔබේ නිවහන ගිමන් සළ කී
නිරා මිස සෙනෙහසේ මල්පිපි ඔබේ හදවත නිසළ විල කී
පුරා සඳ නැගි මගේ අහසට ඔබෙ වදන් තරු පහන් පෙළ කී!

පියාඹා නොව ඇවිද ආවෙමි මෙතෙක් වූ ජීවන ගමන් මග
වියා ගත්තෙමි දිවි කළාලය සදා නොලිහෙන ලෙසින් මුළ අග
ලියා දන්වමි කුමන හෝ වරදක් නිසාවෙන් වියමනේ රඟ!
වියාගත් ඒ දිවි කළාලය තැනින් තැන කඩතොළුව ගිය වග!

"එදා"යා යුතු ගමන වැරදුනි අහේතුව කොතැනකද නොදනිමි
යොදා ගත සිත වෙනත් මඟකින් යළි අලුත් මාවතක ඇදුනෙමි
බදාගෙන තුන් හතර පළ "ඉංග්‍රීසි ටියුෂන්" පන්ති කරනෙමි
මෙදා එමගින් "යමක්" ලබනෙමි සිසුන්ටත් යහපතක් සළසමි!

සිතින්, මුදලින්, ඇඳුම්, අහරින් උදව් කළ මා කළණ මිතුරු
නිතින් කරුණා මවෙත හෙළුවේ සබඳ ඔබ හැර වෙනත් කවුරු
බැතින් සමරමි පියඹ දරු කැළ සුසිත් ගුණදම් සපිරි මහරු
ඉතින් සමුගන්නෙමි දයාමින! මිනිස් ගුණ පාරමී සපිරු!

## 50

# නැණඹර පුන්සඳ!

*නන්දසේන පලිහක්කාර*

පරතෙර දැන හැඳින සිප්සත ඉහළ ඉමේ
නැණඹර පුන් සඳුව දිදුලන දිනුව බිමේ
මහමෙර සදිසි මාතොට - නාවිමන ගමේ
හරසර මල් පොකුරු ඇදුරිඳු හිසට නැමේ

පුරවර දකුණු ලක විදුහල මහින්දේ
සිසුවර වියේ සිප්සතකුරු ඇහින්දේ
තවදුර උගෙන කැලණිය සරසවින්දේ
හරබර බහට දෙතෙරම රට සවන්දේ

තුන් සිත එකමුතුව දුරදිග දුටුව ඇස
චින් තන ගැඹර ගුණ නුවණින් පිරුණු හිස
අන් රසඳුනක් ලොව නැති බව කවිය මිස
රන් සටහනකි ඔබ නිගමන නියත ලෙස

අතැතිව යමක් නැණ සවියෙන් දිනා රට
සුබැසිව මත ගැටුම් නතු කළ විචාරෙට
සසැඳුව අරුත් පෙරʼපර දිග රටාවට
ළබැඳිව නැඹුරු වියතෙකි කෙටි කතාවට

නැවෙන නැවුම් සිතුවිලි පින් සිසු දිවිය
පිදෙන කලාකෙත සරුදුටු සරසවිය
ජීවන සුවඳ-වෙස්සන්තර නවකවිය
සීහෙන විමැසුම්ය ගැලපුම් රස කවිය

කවි සරණිය-තිසර සරසවි කැලණි කවි
සිව් දිග පසිදු සැකසුම් ඉගෙනුමට සවි
තිව් කිවි දෙපස මග ඇදුරිඳු නතර නොවි
ගව් ගණනක දුරකි ලියැවෙන පෙරට යැවි